*සැ. යු.* - 2023.08.04 දින පළ කරන ලද අංක 2,344 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,345 - 2023 අගෝස්තු මස 11 වැනි සිකුරාදා - 2023.08.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 852 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 සැප්තැම්බර් මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 අගෝස්තු මස 18 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

851- B 824782— 5,403 (2023/08)

# පළාත් පාලන නිවේදන

## බේරුවල ප්‍රාදේශීය සභාව

### මාර්ග - නම් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ මාලේවන්බද්ද උපකාර්යාල බල ප්‍රදේශයට අයත් පහත උපලේඛනයේ විස්තර කර ඇති මාර්ගය “රණවිරු කෝප්‍රල් එම්. වී. අජිත් කුමාර මාවත” යන නමින් භාවිතා කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ 2022.08.16 දින පැවති මාසික සභා රැස්වීමේ දී අංක ඊ.1.10 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් එම මාර්ගය 2023.03.16 දින සිට “රණවිරු කෝප්‍රල් එම්. වී. අජිත් කුමාර මාවත” යනුවෙන් නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

අශෝක රණසිංහ,
ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බේරුවල ප්‍රාදේශීය සභාවේ
බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ජූලි මස 24 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය සභාවේ දී ය.

#### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | : | බේරුවල ප්‍රාදේශීය සභාව |
| 2. | දිස්ත්‍රික්කය | : | කළුතර |
| 3. | ප්‍රා. ලේ. කොට්ඨාශය | : | බේරුවල |
| 4. | දැනට භාවිත වන නම | : | අළුත්ගම - මතුගම යටදොළ මාර්ගයෙන් ආරම්භ වී පුරේගොඩ දක්වා දිවෙන මාර්ගය |
| 5. | මාර්ගයේ ආරම්භය | : | අලුත්ගම-මතුගම යටදොළ මාර්ගයෙන් |
| 6. | මාර්ගයේ අවසානය | : | පුරේගොඩ දක්වා |
| 7. | අලුතින් යොදා ඇති නම | : | “රණවිරු කෝප්‍රල් එම්. වී. අජිත් කුමාර මාවත” |

08-173

---

## බේරුවල ප්‍රාදේශීය සභාව

### මාර්ග - නම් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ පයාගල උපකාර්යාල බල ප්‍රදේශයට අයත් පහත උපලේඛනයේ විස්තර කර ඇති මාර්ගය “පූජ්‍ය ශ්‍රී ධම්මරතන නාහිමි මාවත” යන නමින් භාවිතා කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ 2022.03.15 දින පැවති මාසික සභා රැස්වීමේ දී අංක ඊ.1.10 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් එම මාර්ගය 2023.04.06 දින සිට “පූජ්‍ය ශ්‍රී ධම්මරතන නාහිමි මාවත” යනුවෙන් නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

අශෝක රණසිංහ,
ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බේරුවල ප්‍රාදේශීය සභාවේ
බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ජූලි මස 24 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | : | බේරුවල ප්‍රාදේශීය සභාව |
| 2. | දිස්ත්‍රික්කය | : | කළුතර |
| 3. | ප්‍රා. ලේ. කොට්ඨාශය | : | බේරුවල |
| 4. | දැනට භාවිත වන නම | : | ගාලු පාර අම්බලප්පොල හන්දිය (රේල් පාර අසළ) සිට රොක්ලන්ඩ් පාරට සම්බන්ධ වන ස්ථානය දක්වා දිවෙන මාර්ගය |
| 5. | මාර්ගයේ ආරම්භය | : | ගාලු පාර අම්බලප්පොල හන්දියෙන් (රේල් පාර අසළ) |
| 6. | මාර්ගයේ අවසානය | : | රොක්ලන්ඩ් පාරට සම්බන්ධ වන ස්ථානය දක්වා |
| 7. | අලුතින් යොදා ඇති නම | : | "පූජ්‍ය ශ්‍රී ධම්මරතන නාහිමි මාවත" |

08-174

---

**මාතර මහා නගර සභාව**

1975 අංක 17 දරන සමාජශාලා බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාවලට එහි සඳහන් ස්ථානයේ පැවැත්වීම සඳහා 2023 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම සඳහා මා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලා අසල හෝ එකී සමාජශාලා සඳහා අපේක්ෂිත ස්ථානය අදාළ හෝ පදිංචි යම් තැනැත්තකු එම ක්‍රීඩා සමාජශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන්නේ නම් නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 04 ක් ඇතුලත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් 02 න් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

කාංචනා කේ. තල්පාවිල,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මාතර.

2023 ජූලි මස 31 වැනි දින,
මහා නගර සභාව,
මාතර.

**උපලේඛනය**

| *අයදුම්කරුගේ නම* | *සමාජශාලාවේ ලේකම්/සභාපති/කළමනාකරු* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යන ස්ථානය* |
|---|---|---|---|
| කෞශලා ඩිල්රුක්ෂි ස්ටෙම්බො | ලේකම් | බිලූමූන් ක්‍රීඩා සමාජය | අංක 241/C, ගාලු පාර, පඹුරණ, මාතර |

08-266

**පාතදුම්බර ප්‍රාදේශීය සභාව**

2023 වර්ෂය සඳහා ගවමස්, එළුමස්, වෙළඳසැල් පවත්වාගෙන යාම වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ ඒ ස්ථානයන්හි ගවමස්, එළුමස් වෙළඳාම් කරගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ඉදිරිපත්ව සිටින බව සෝගාතක ආඥාපනතේ 272 වැනි අධිකාරිය 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට දින 14 ක් (දහතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

මෙම කාලසීමාව තුල මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් මෙහි උපලේඛනයේ සඳහන් ඉල්ලුම්කරුවන් වෙත අදාළ ව්‍යාපාර ස්ථානවල වෙළෙඳාම කරගෙන යාම සඳහා 2023.09.01 සිට 2023.12.31 වැනි දින දක්වා බලපත්‍ර ලබා දීම කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශට පත් කරමි.

පී. එච්. ධර්මරත්න,
ලේකම්,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2023 ජූලි මස 31 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *වෙළඳාම් කරන ස්ථානය* | *වෙළෙඳාමේ ස්වභාවය* |
|---|---|---|
| ඒ. ඒ. එම්. මසාහිම් මයා | 7 බී/2, පොල්ගොල්ල | එළුමස් |

08-267

---

**කරෙයිනගර් ප්‍රාදේශීය සභාව**

චක්කලාවෝඩෙයි ප්‍රදේශයේ අලුතින් ආරම්භ කරන ලද මාළු වෙළඳපොලේ ව්‍යාපාර කටයුතු සිදු කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වගන්තියේ අධිකාරිය යටතේ ඇති කරෙයිනගර් ප්‍රාදේශීය සභාව 2023 අගෝස්තු මස 03 දිනැති පරිපාලන නියෝගය අංක 99 මගින් 2023.01.20 වැනි දින චක්කලාවොඩෙයි හි දී විවෘත කළ මාළු වෙළෙඳ පොළක් පැවැත්වීමට තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශ කරමි.

කි. විජයේෂ්වරන්,
ලේකම්,
කරෙයිනගර් ප්‍රාදේශීය සභාව.

2023 අගෝස්තු මස 03 වැනි දින,
කරෙයිනගර් ප්‍රාදේශීය සභාව.
කරෙයිනගර්.

**පරිපාලන නියෝගය අංක 99/03.08.2023**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වැනි වගන්තිය යටතේ කරෙයිනගර් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව, 2023.01.11 දින පැවැත්වුණු සභාවේ පනස් අටවැනි සාමාන්‍ය මහා සභා රැස්වීමේ අංක 789 ට අනුව 2023.01.20 දින සිට චක්කාලවෝඩෙයිහි අලුතින් ස්ථාපිත කර ඇති මත්ස්‍ය වෙළඳපොළේ ව්‍යාපාර කටයුතු සිදු කළ යුතු බවට තීරණය කර ඇති අතර, එම වෙළඳපොල විස්තර ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, එම වෙළඳපොළේ මාළු වෙළඳාම් කිරීමට කැමති වෙළෙන්දන් ප්‍රකාශයට පත් කිරීමටත් මෙයින් තීරණය කරමි. මාළු වෙළඳාම් කිරීමට ප්‍රාදේශීය සභාවෙන් අවසර ලබා ගත යුතු බවත් නිවේදනය කරමි.

08-558

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව


### වවුනියාව උතුර ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි පහත සඳහන් ප්‍රදේශ දියුණුකළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව වවුනියාව උතුර ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි සහ පහත උපලේඛනයේ සඳහන් කරන ලද ග්‍රාම නිලධාරි කොට්ඨාස, දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරන බව වර්ෂ 2022 ඔක්තෝබර් මස 26 වැනි දිනැති අංක VNPS/2022/GM/10/55/19 දරන සභාවේ යෝජනාව අනුව වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ලදී.

පහත උපලේඛනයේ සඳහන් පරිදි වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ දියුණු කළ ප්‍රදේශ වශයෙන් 2023.08.03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉහත නීතිය අනුව ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් දෙයිවේන්ද්‍රම් රදීශ්වරන් වන මා අනුමැතිය ලබා දෙමින් මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දෙයිවේන්ද්‍රම් රදීශ්වරන්,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්.

2023 අගෝස්තු මස 03 වැනි දින,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
වවුනියාව.



**උපලේඛනය - 01**

*ගොඩනැගිලි පිහිටි ප්‍රදේශ ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ ගම්මාන*

| *අනු. අංකය* | *කොට්ඨාස නම සහ අංකය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාස* | | *ග්‍රා. නි. කොට්ඨාශ අංකය* | *වර්ග ප්‍රමාණය (ව.කි.මී.)* | *ග්‍රා. නි. කොට්ඨාසවලට අයත් ගම්මාන* |
|---|---|---|---|---|---|---|
| 1 | කනගරායන්කුලම් උතුර මන්නකුලම් කොට්ඨාස අංක - 01 | 01 | කනගරායන්කුලම් උතුර | 225A | 27.9 | 1. කනගරායන්කුලම් උතුර<br>2. පෙරියකුලම්<br>3. මුදිරංකුලම්<br>4. කුන්ජුමුරියාක්කුලම් |
| 2 | කනගරායන්කුලම් දකුණ කොට්ඨාස අංක - 02 | 01 | කනගරායන්කුලම් දකුණ | 225 | 20.5 | 1. කනගරායන්කුලම් දකුණ<br>2. කුරිසුට්ටකුලම්<br>3. පුදුක්කුලම්<br>4. ආලංකුලම්<br>5. අම්පාල්නගර් |
| 3 | නෙඩුංකේණි කොට්ඨාස අංක - 05 | 01 | නෙඩුංකේණි දකුණ | 222 | 8.3 | 1. සිවානගර්<br>2. නෙඩුංකේණි දකුණ<br>3. සුඩුවේන්දාන්<br>4. රම්බෙකුලම්<br>5. නෙඩුංකේණි නගරම්<br>6. මරුදන්කුලම් |
| | | 02 | නෙඩුංකේණි උතුර | 222A | 1.9 | 1. නාවලර් වීදි<br>2. කාන්තා කෘෂිකර්ම ව්‍යාපෘතිය<br>3. සාණ්ඩාකුලම්<br>4. 6 වන සැතපුම |
| 4 | පුලියංකුලම් උතුර සහ දකුණ කොට්ඨාස අංක - 07 | 01 | පුලියංකුලම් දකුණ | 224 | 40.9 | 1. පුලියංකුලම් දකුණ<br>2. රාමර් පුලියංකුලම්<br>3. කල්මඩු<br>4. පළෛයවාඩි |
| | | 02 | පුලියංකුලම් උතුර | 224A | 94.8 | 1. මුත්තුමාරි නගර්<br>2. පරසන්කුලම්<br>3. පුතූර් හන්දිය<br>4. පුතූර්<br>5. කුරුක්කල්කුලම් |

08-425

## කෝරලයිපත්තු ප්‍රාදේශීය සභාව - වාලච්චේනයි

### කෝරලයිපත්තු ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ප්‍රදේශයන් සංවර්ධිත ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත්කිරීම


1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කෝරලයිපත්තු ප්‍රාදේශීය සභාව විසින් 2023 මාර්තු මස 08 වන දින විශේෂ සභා රැස්වීමේ දී තීරණ අංක KPPS/M. Meeting/60-II/MARCH/10/2023 යටතේ සභාව විසින් සම්මත කරන ලද යෝජනාවට එකී පනතේ ඉහත කී වගන්තියෙන් මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් සින්නරාසා ප්‍රකාශ් වන මම අනුමැතිය ලබා දෙන බව මෙයින් මහජනතාවට දැනුම් දෙමි.

සින්නරාසා ප්‍රකාශ්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කය.

**තීරණය**

1987 වර්ෂයේ 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කෝරලයිපත්තු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටුවා ඇති පහත වගුවේ සඳහන් කර ඇති ප්‍රදේශයන් සංවර්ධිත ප්‍රදේශයන් බව පිළිගත යුතු බවත්, එසේ පිළිගන්නා යෝජනාව නීතිමය වශයෙන් සම්මත කිරීමට මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන ක්‍රියාකළ යුතු බව කෝරලයි පත්තු ප්‍රාදේශීය සභාව තීරණය කර ඇත.

| *කොට්ඨාසයේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක* |
|---|---|---|
| වාලච්චේනයි මුස්ලිම් | වාච්චේනෙයි 04 මුස්ලිම් | 206 |
| | වාලච්චේනෙයි මුස්ලිම් දකුණ | 206D |
| බයන්දූරච්චේනෙයි උතුර | බයන්දූච්චේනයි උතුර | 206A |
| | වාලච්චේනෙයි 5 මුස්ලිම් | 206B |
| වාලච්චේනෙයි දෙමළ | වාලච්චේනෙයි දෙමළ | 205 |
| | පුදුකුඩිඉරිප්පු | 205A |
| කල්කුඩා | කල්කුඩා | 204 |
| | පේතාලෙයි | 205B |
| කල්මඩු | කල්මඩු | 204A |
| | කන්නහිපුරම් | 205D |
| බයන්දූරච්චේනෙයි දකුණ | බයන්දූරච්චේනෙයි දකුණ | 206C |
| සෙම්මන්ඕඩෙයි | මාවඩිච්චේනෙයි | 208A |
| | සෙම්මන්ඕඩෙයි | 208D |
| කරුවාකරණි | මීරාඕඩෙයි දෙමළ | 202 |
| | කරුවාකර්ණි | 202A |
| කින්නෙයිඅඩි | කින්නෙයිඅඩි | 202B |
| | සුංගාන්කර්ණි | 202C |
| | කුඹුරුමුලෙයි | 203B |
| කිරාන් | කිරාන් නැගෙනහිර | 203 |
| | කිරාන් බටහිර | 203A |
| සන්දිවෙලි | සන්දිවෙලි | 200 |
| | කෝරකල්ලිමඩු | 203C |
| මොරෙකොට්ටාන්චේනෙයි | මොරෙකොට්ටාන්චේනෙයි | 199 |
| | දේවපුරම් | 199A |
| | පාලෙයිඅඩිතෝන | 200B |






ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.